**උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය, අමතර අරමුදල් - පළාත් සංරචකය 2013 ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වා**

**---------------------------------------------------------------------------------------------------------------**

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය, අමතර අරමුදල් - පළාත් සංරචකයේ 2013 ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2012 නොවැම්බර් 19 දින එළඹි අංක 2890-එස්ආර්අයි(එස්එෆ්) දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.04 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම,අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------**

උතුරු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය, අමතර අරමුදල් - පළාත් සංරචකයේ ණය ගිවිසුමට අනුව, උතුරු පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ උතුරු මැද පළාත් සභාවේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, උතුරු පළාත තුළ සහ ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය සහ දකුණු ප්‍රදේශය අතර මාර්ග සම්බන්ධතාවයන් වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘතියේ කටයුතු සමන්විත වනුයේ,

<u>ආ කොටස - ප්‍රතිසංස්කරණය හා ප්‍රතිස්ථාපනය</u>

උතුරු පළාතේ පළාත් මාර්ග කිලෝ මීටර් 50 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරා ගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

<u>ඇ කොටස - ප්‍රතිසංස්කරණය හා ප්‍රතිස්ථාපනය</u>

උතුරු මැද පළාතේ පළාත් මාර්ග කිලෝ මීටර් 70 ක් පුනරුත්ථාපනය කිරීම සහ තෝරා ගත් පාලම් පුනරුත්ථාපනය සහ / හෝ ප්‍රතිස්ථාපනය කිරීම.

ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 33.67 ක් වන අතර, ඉන් එජඩො මිලියන 28.9 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ බදු හා තීරු ගාස්තු සඳහා එජඩො මිලියන 4.77 ක මුදලක් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ඇත. 2013 ජුලි 01 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර, 2017 දෙසැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදී හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සළකණු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ). අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා

ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව,

(ආ). ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඇ). ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුනේ ද යන බව,

(ඈ). ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව,

(ඉ). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව,

(ඊ). පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව,

(එ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව,

**3. මතය**

-------

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ). 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ). සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ,

(ඇ). ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**4.1 මූල්‍ය කාර්යසාධනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2013 ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘති වියදම රු. 154,104,294 කි. 2013 දෙසැම්බර් 31 දිනට වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | 2013 ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා වියදම |
|---|---|
| | රු. |
| සිවිල් වැඩ | 152,944,920 |
| ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය | 1,159,374 |
| | 154,104,294 |

4.2 **අග්‍රිම අරමුදල් ගිණුම**

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 ජුලි 01 සිට දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාලපරිච්ඡේදය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙහි මෙහෙයුම් සිදුවී නොමැත.

**5. විගණන නිරීක්ෂණ**

**5.1 නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබීය.

(අ). 2013 සැප්තැම්බර් 01 දිනැති අංක එස්ර්සී/2013/07 දරණ දේශීය ආදායම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධාන අනුව උතුරු මැද පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක

කිරීමේ ඒකකයේ සේවයේ නියුතු නිලධාරීන් 04 කුගේ වැටුපෙන් උපයන විට ගෙවීම් බදු අයකර ගෙන නොතිබුණි.

(ආ). රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.10.2 වගන්තිය අනුව කොන්ත්‍රාත් වටිනාකම රු. 250,000,000 ඉක්මවන කොන්ත්‍රාත් පිරිනැමීම් සම්බන්ධයෙන් තොරතුරු අවම වශයෙන් පුළුල්ව සංසරණය වන එක් ජාතික පුවත්පතක සහ රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම අනිවාර්ය වේ. නමුත්, ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පිරිනැමීම් සම්බන්ධයෙන් ඉහත ක්‍රියා පිළිවෙල අනුගමනය කර නොතිබුණි.

## 5.2 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යානය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අයවැය වෙන්කිරීම් සහ තථ්‍ය අරමුදල් උපයෝජනයට අදාල, වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ

| | ඇස්තමේන්තුගත මුළු ව්‍යාපෘති පිරිවැය | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | 2013 වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | | 2013 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලි. | රු. මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. | එජඩො මිලි. | රු. මිලි. |
| ආසබැ | 28.90 | 3,641.40 | 142 | 1.080 | 136.1 | 1.080 | 136.1 |
| ශ්‍රීලංර | 4.77 | 601.02 | 8 | 0.063 | 7.9 | 0.063 | 7.9 |
| එකතුව | 33.67 | 4,242.42 | 150 | 1.143 | 144.0 | 1.143 | 144.0 |

## 5.3 භෞතික කාර්යසාධනය

(අ). ණය ගිවිසුම අනුව, උතුරු පළාතේ දුර කිලෝමීටර් 51.71 ක් වූ මාර්ග 07 ක් සහ උතුරු මැද පළාතේ දුර කිලෝමීටර් 75.65 ක් වූ මාර්ග 07 ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුල පුනරුත්ථාපනය කිරීමට බලාපොරොත්තු විය. සමස්ථ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ

සැලැස්ම අනුව, 2013 දෙසැම්බර් 31 දිනට පෙර සුදුසු කොන්ත්‍රාත් කරුවන් තෝරාගෙන සියලුම සිවිල් වැඩ ආරම්භ කිරීම සහ කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා උපදේශකයින් පත් කිරීම කළ යුතු වේ. කෙසේ වුවත්, 2013 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම හෝ උපදේශකයින් පත් කිරීම හෝ උතුරු පළාත විසින් සිදු කර නොතිබුණි.

(ආ). ප්‍රමාණ පත්‍රවලට අනුව, පුනරුත්ථාපනය කාර්යයන් සඳහා තෝරාගත් මාර්ගවල ආරම්භක හා අවසාන ස්ථානයන්හී පුනරුත්ථාපන කාර්යන්ට අදාල තොරතුරු ඇතුළත් මාර්ග නාම පුවරු ස්ථාපිත කළ යුතු වේ. 2014 අගෝස්තු 24 දින වන විට මාර්ග පහක එවැනි නාම පුවරු ස්ථාපිත කර නොමැති බව භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඇ). ණය ගිවිසුමේ 5 වන උපලේඛනය අනුව, ව්‍යාපෘතිය විසින් ණය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස 3 තුළ ප්‍රසම්පාදනයන් ඇතුළත් ව්‍යාපෘති කාර්යයන් සම්බන්ධ තොරතුරු හෙළි කිරීම සඳහා වෙබ්අඩවියක් සංවර්ධනය කළ යුතු වේ. කෙසේ වුවත්, 2014 සැප්තැම්බර් වන විටද එවැනි වෙබ්අඩවියක් සංවර්ධනය කර නොතිබුණි.